චක්‍රලේඛ අංක :02/2013

මගේ අංකය : බප/සසේකො/6/චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
කිරුළපන මාවත ,
කොළඹ 05

2013-03- 01

බස්නාහිර පළාතේ සියළුම
විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
ස.ණ.ස. සමිතිවල සභාපතිවරුන් වෙත ,

## බස්නාහිර පළාත් සමුපකාර සමිතිවල සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන් සඳහා නිවාඩු දින දීමනා ගෙවීම.

---

බස්නාහිර පළාතේ සමුපකාර සමිතිවල සේවයේ නියුක්තව සිටින මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් සේවා අවශ්‍යතාවය මත නිවාඩු දින රාජකාරියේ යොදවා ගැනීමට සිදුවන අවස්ථාවන් හි, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, ඔවුන ගේ නිවාඩු දින වැටුප්, දිනකට දින1 ½ ක වැටුපක් ලෙස ගණනය කර, දිරිමත්කිරීමේ දීමනාවක් වශයෙන් ගෙවීම බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමතකරඇත.

I. මෙහිදී, නිවාඩු දින වැටුප් ගෙවීමට අදාලව දැනට පවත්නා අනෙකුත් රෙගුලාසි නොවෙනස්ව පවතින අතර, දීමනාව ගණනය කිරීමේ දී පමණක්, එක් නිවාඩු දින රාජකාරියක් වෙනුවෙන් දින 1 ½ ක වැටුප් ගෙවීම කළ යුතු වේ.

II. බස්නාහිර පළාත් සමුපකාර සේවක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ කළමනාකරණ මට්ටම වශයෙන් වර්ගීකරණය කර ඇති තනතුරු, මාණ්ඩලික මට්ටමට අයත් තනතුරු වශයෙන් සැලකිය යුතු වේ.කෙසේ වෙතත් , මේ වන විටත් නිවාඩු වැටුප් හිමිකම් ලබන තනතුරු සඳහා පෞද්ගලික වන සේ මෙම ගෙවීම අනුමත කරනු ලැබේ.

III. මාණ්ඩලික නිලධාරීන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත, හුදෙක් අත්‍යවශ්‍ය රාජකාරී කටයුතු සඳහා පමණක් නිවාඩු දින රාජකාරියේ යොදවා ගත යුතු වන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම දීමනා ගෙවීමේ කටයුතු සිදු කළ යුතු වේ.

IV. මෙම දීමනාව ස්ථිර, අනියම්, තාවකාලික මාණ්ඩලික නිලධාරීන් හට මෙන්ම, කොමිෂන් සභා අනුමැතිය ඇතිව වැඩ බලන සහ කොන්ත්‍රාත් පදනමින් සේවය කරන මාණ්ඩලික නිලධාරීන් ට ද ගෙවිය යුතු වේ.

V. මෙම නිවාඩු දින දීමනාව ගෙවීම ට මූල්‍යමය හැකියාව සමිතිය/ සංගමය සතු විය යුතු අතර, ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් විය යුතුය.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

අයි.ආර්.සෝමසිරි,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්-

1. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්
2. ලේකම්,බස්නාහිර පළාත් ප්‍රවාහන හා ක්‍රීඩා කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,ආහාර සැපයීම් හා බෙදා හැරීම්,සමුපකාර සංවර්ධන හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ සමුපකාර අමාත්‍යාංශය
3. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
4. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
5. සියළුම පළාත් සමුපකාර කොමිෂන් සභා ලේකම්වරුන්
6. සියළුම වෘත්තිය සමිති සංගම්.